# දිවිනසා ගන්නේ මානසික රෝගීන් ද?

**මනෝවෛද්‍ය සරත් පඬුවාවල**

**වර්තමානයේ මෙරට දිවිනසා ගන්නා හා ඊට උත්සාහ කරන අය අතර තරුණ වියේ පසුවන්නන් සුලබ ය. දිවිනසා ගත් අය අතර පුරුෂ පක්ෂයේ අය වැඩි ය. දිවිනසා ගැනීමට උත්සාහ කරන අය අතර කාන්තාවන් වැඩිපුර දක්නට ලැබේ. කලින් සඳහන් කළ පරිදි මෙරට දිවිනසා ගැනීම සඳහා සුලබව භාවිත කරන්නේ විෂ ද්‍රව්‍යයන් ය.**

දිවිනසා ගැනීම් ලොව සෑම ජන කණ්ඩායම් අතරම සිදුවන්නකි. වර්තමානයේ ලොව ඉහළම දිවිනසා ගැනීම් සංඛ්‍යාවක් වාර්තාවන්නේ ලංකාවෙනි. සංඛ්‍යාත්මකව සැලකුවහොත් මෙම සංඛ්‍යාව වර්ෂයකට ජනගහනයෙන් ලක්ෂයකට 50 කට ආසන්න වේ. ශ්‍රී ලංකාවේ රෝහල්වල සිදුවන මරණවලට හේතුවන කරුණු අතර පළමු දහයට දිවිනසා ගැනීම් අයත් ය. ගෙල වැළලා ගැනීම්, දියේ ගිලීම් හා ධාවනය වන දුම්රිය ඉදිරියට පැනීම වැනි නොයෙකුත් ක්‍රම තිබුණ ද, දිවිනසා ගැනීම සඳහා මෙරට භාවිත වන ප්‍රධානතම ක්‍රමය කෘමිනාශක හා වල්නාශක භාවිතය යි.

සමාජමය සාධක ගැන සැලකුවහොත් යම් පුද්ගලයින් සමාජය තුළ හුදකලාවීම, සමාජයේ ඒකාග්‍රතාව බිඳවැටීම, දිවිනසා ගැනීමේ ප්‍රවණතාව වැඩිකරවයි. මීට අමතරව යම් අරමුණක් වෙනුවෙන් කරන දිවිනසා ගැනීම් ද මෙකල සුලබව දක්නට ලැබේ. දෙවන ලෝක යුදසමයේ ජපනුන් බෝම්බ බැඳගෙන සතුරු නැව්වලට පැනීම, ප්‍රතිවාදීන් විනාශ කිරීමේ අරමුණින් පලස්තීන හා දමිළ තරුණ තරුණියන් බෝම්බ ඇඳුම් ඇඳ අදාළ කාර්යයේදී දිවිනසා ගැනීම ආදිය මීට උදහරණ වේ. මීට අමතරව යම් කාර්යයක් කරවා ගැනීමට බලපෑම් කරන අටියෙන් සිරුරට ගිනි තබාගෙන දිවිනසා ගත් පුද්ගලයින් ගැන පසුගිය කාලයේ වාර්තා විය.

දිවිනසා ගැනීමට තුඩු දෙන සෞඛ්‍යමය සාධක අතර මානසික හා කායික රෝග ද වෙයි. තදබල ලෙස ශෝකයෙන් රෝගීවීම නොහොත් විෂාදමය තත්ත්ව දිවිනසා ගැනීමේ ප්‍රවණතාව වැඩි කරවන මානසික රෝග අතර ප්‍රධාන තැනක් ගනී. විෂාදය හටගැනීමට හේතුවිය හැකි කරුණු අතර මානසික හා සමාජමය පීඩන මුල්තැනක් ගනී. තදබල විෂාදය නිසා දිවි නසා ගැනීම් මහලුවියේ සිටින්නන් අතර සුලබ ය. මීට හේතු සාධක වන කරුණු අතර තමා හදවාගත් දරුවන් නොසැලකීම සමාජමය වශයෙන් තනිවීම හා මහලුවියේ ආබාධිත බව ආදිය සඳහන් කළ හැක. තම පවුලේ අනෙක් සාමාජිකයන් ද මරා දමා තමා ද දිවිනසා ගැනීම විෂාදයෙන් පෙළෙන සමහරුන් අතර දක්නට ලැබේ. බිරිඳ තම තනි කැමැත්තට රට ගිය අතර දරුවන් ඝාතනය කර දිවි නසාගත් පියවරුන් පිළිබඳ වාර්තා පසුගිය කාලයේ අසන්නට ලැබුණි.

භින්නෝන්මාදයෙන් පෙළෙන සමහර රෝගීන් ද දිවිනසා ගැනීමට උත්සාහ කළ අවස්ථා දක්නට ලැබේ. මෙවන් රෝගීන්ගේ ප්‍රධාන ලක්ෂණයක් වන්නේ අසාමාන්‍ය සංවේදන දැනීමයි. මේවා අතර ශ්‍රවණභ්‍රාන්තිමය තත්ත්ව (අන් අයට නොඇසෙන ශබ්ද ඇසීම) සුලබ ය. සමහර රෝගීන් මෙවැනි අසාමාන්‍ය අප්‍රසන්න අත්දැකීම් දරාගත නොහැකිව දිවි තොර කර ගැනීමට පෙළඹෙන අතර, සමහර අය එවැනි අවස්ථාවලදී ලැබෙන අණ කිරීම්වලට ප්‍රතිචාර දක්වන්නේ දිවිනසා ගැනීමෙනි.


මත්පැන් හා මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වූවන් අතර ද දිවි තොර කර ගැනීම් දක්නට ලැබේ. මීට බොහෝවිට හේතු වන්නේ එම ද්‍රව්‍ය නොලැබීම නිසා හටගන්නා අප්‍රසන්න තත්ත්ව සමග අනෙකුත් මානසික හා සමාජමය කරුණු ය. හෙරොයින් භාවිතයට ඇබ්බැහි වූවන් පසුගිය දිනවල වෙළෙඳපොළේ එම ද්‍රව්‍යයේ හිඟයක් පැවතීම හේතුවෙන් විරමණ ලක්ෂණ වලින් පෙළුනාහ. සමහරු එම ලක්ෂණ දරාගත නොහැකිව දිවිනසාගත් බවට වාර්තා විය.

පෞරුෂයේ විෂමතා ඇති පුද්ගලයින් අතර සමාජ ඇසුරේ නොයෙකුත් අඩුපාඩු දක්නට ලැබේ. සමාජයට මුහුණදීමට නොහැකිවීම ඇතුළු අනෙකුත් ගැටුම්කාරී තත්ත්ව නිසා සමහරු දිවිනසා ගනිති.

කුඩා කළ සිට නිදන්ගත රෝගවලින් පෙළෙන්නවුන් අතර තරුණවියේදී දිවිනසා ගැනීමේ ප්‍රවණතාව වැඩි ය. උදහරණ ලෙස පාලනය නොවන අපස්මාරය, ඇදුම හා දියවැඩියාව ආදී රෝග මෙහිදී සඳහන් කළ හැක. මෙවැනි රෝගවලින් පෙළීම හා දිගුකාලීන ඖෂධ භාවිතය නිසාත් තම අනාගතය ගැන අශුභවාදී අදහස් වලින් හෙබි ඔවුහු, මෙලොව ජීවත්වීමෙන් වැඩක් නැති බව සිතා බොහෝවිට තමා භාවිත කරන ඖෂධ වැඩි මාත්‍රාවක් ගෙන දිවිනසා ගැනීමට තැත් කරති. එසේම හෘදරෝග හා පිළිකා ආදියෙන් පෙළෙන වැඩිහිටියන් ද දිවි තොර කර ගන්නා අවස්ථා නිතර අසන්නට ලැබේ.

වර්තමානයේ මෙරට දිවිනසා ගන්නා හා ඊට උත්සාහ කරන අය අතර තරුණ වියේ පසුවන්නන් සුලබ ය. දිවිනසා ගත් අය අතර පුරුෂ පක්ෂයේ අය වැඩි ය. දිවිනසා ගැනීමට උත්සාහ කරන අය අතර කාන්තාවන් වැඩිපුර දක්නට ලැබේ. කලින් සඳහන් කළ පරිදි මෙරට දිවිනසා ගැනීම සඳහා සුලබව භාවිත කරන්නේ විෂ ද්‍රව්‍යයන් ය. මේවා අතර කෘමිනාශක හා වල්නාශක ප්‍රමුඛ ය. මීට අමතරව ඖෂධ වැඩි මාත්‍රාවක් ගැනීම හා ගේ දොර භාවිත කරන නොයෙකුත් රසායන ද්‍රව්‍ය ආදිය ද භාවිත කෙරේ.

විෂාදයෙන් පෙළෙන්නන් දිවිනසා ගැනීම හොඳින් සැලසුම් කරති. ඔවුහු අන් අයගේ අවධානයට ලක්වීමෙන් තොරව අනිවාර්යයෙන් ම මියැදෙන ක්‍රම භාවිත කරති. ඔවුන්ගේ එකම අරමුණ මිය යාම යි. දිවිනසා ගැනීමට උත්සාහ කරන බොහෝ දෙනෙකුගේ අවසන් අරමුණ මිය යාම නොවේ. අන් අය ඉදිරියේ වස පානය කිරීම, වස පානය කිරීමෙන් පසු "මං වස බිව්වෝ" කියා කෑ ගැසීම හා අවට සිටින්නන්ට ඒ බව ප්‍රකාශ කිරීම, ප්‍රථමාධාර සඳහා ක්‍රියාකාරීවීම ආදී ක්‍රියාවන්ගෙන් පෙනී යන්නේ ඔවුන් වස බීම හා මිය යාම පිළිබඳ බියෙන් සිටින බවත් ය. ඇත්තෙන්ම ඔවුන්ගේ අරමුණ මිය යාම නොවේ. හදිසියේ වස පානය කිරීම හා එහි තදබල විෂ ගතිය නිසා, සමහරුන්ට මිය යාමේ අදහසක් නොතිබුණත්, හරියාකාරව



කලට වේලාවට ප්‍රතිකාර නොලැබීම නිසා මියැදෙති. ඇත්ත වශයෙන්ම මෙරට දිවිනසා ගැනීමේ සංඛ්‍යාව ඉහළ ගොස් ඇත්තේ විශේෂයෙන් මෙම කරුණ නිසා ය.

තමුන්ගේ යම් ගැටලුවකට අනුන්ගේ අවධානය යොමු කර ගැනීමේ චේතනාවෙන් සමහරු දිවිනසා ගැනීමට උත්සාහ කරති. සමාජයට මුහුණදීමේ ලැජ්ජාවෙන් දිවිනසාගත්තා අය අතර ලිංගික අතවරවලට ගොදුරු වූ තරුණියන් වෙති. බලාපොරොත්තු කඩවීම නිසා හදිසියේ හටගන්නා විෂාදමය ප්‍රතික්‍රියාවන් නිසා සමහරු දිවිනසා ගැනීමට පෙළඹෙති. විභාගයෙන් තමා බලාපොරොත්තු වූ ප්‍රතිඵල නොලැබීම, පෙම් සබඳතා බිඳ වැටීම ආදිය මීට උදාහරණයි.

මෙරට සිදුවන දිවිනසා ගැනීම්වලට හේතුවන වැදගත් කරුණක් වන්නේ පළිගැනීමේ චේතනාවයි. මින් බලාපොරොත්තු වන්නේ තමන්ගේ මරණය නිසා අන් අයට මානසික වේදනාවක් හා පශ්චාත්තාපයක් ඇතිකර වීමයි. පවුලක සාමාජිකයෙක් පවුල තුළ කිසියම් ගැටුමක ප්‍රතිඵලයක් ලෙස මේ අයුරින් දිවිනසා ගැනීම් නිතර දක්නට ලැබේ. තරුණ තරුණියන් අතර දිවිනසා ගැනීම් රැසකට මෙම කරුණ බලපායි. දෙමාපියන් යම් කරුණකට අවවාද කළ විට තරුණ දරුවෙක් දිවිනසා ගන්නේ බොහෝවිට මෙවන් මානසික තත්ත්වයක් යටතේ ය. "මං මැරුණම ඔක්කොම ඉවරනෙ. එතකොට තේරෙන්නේ නැතෑ. ඒ අය දුක්වෙයිනෙ" ආදී වශයෙන් පුද්ගලයා සිතනු ඇත. මේ තත්ත්වය සමහර අඹුසැමි දිවිනසා ගැනීම් වලදී ද දක්නට ලැබේ.

මෙවැනි මානසික තත්ත්වයකින් හෙබි සංසිද්ධියක් කුඩා ළමුන් හා ඔවුන්ගේ මව්වරු අතර, විශේෂයෙන් ආහාර ගැනීම සම්බන්ධව දක්නට ලැබේ. මව දරුවාට ආහාර ගැනීමට බල කරන අතර එසේ නොගතහොත් මානසිකව අසහනයට පත් වේ. මෙය දන්නා දරුවා තමාට යම් යම් දේ මව ලවා කරවා ගැනීම අවශ්‍ය වූ විට ආහාර නොගෙන සිටී. මින් දුකට පත්වන මව දරුවාට අවශ්‍ය දේ ලබාදීම හා ඉන් අනතුරුව දරුවා ආහාර ගැනීම සිදු වේ. මෙවැනි මානසිකත්වයක් වර්ධනය වූ දරුවා තුරුණුවියේ දී දිවිනසා ගැනීමට තර්ජනය කිරීම හෝ එසේ කිරීමට උත්සාහ කිරීම සිදුවිය හැකි ය. වයස අවුරුදු 8- 9 පමණ වයසේ දරුවන් දෙමව්පියන් ලවා යම් යම් දේ කරවා ගැනීමේ අටියෙන් වස බොන බවට තර්ජනය කරන අවස්ථා හා එසේ වස පානය කළ අවස්ථා ද අප දැක ඇත.

දිවිනසා ගන්නා බොහෝ දෙනෙක් යම් යම් මානසික හා සාමාජීය හේතු නිසා කාලයක පටන් මානසික පීඩාකාරී බවකින් පෙළීමට පුළුවන. එවැනි පීඩාකාරී තත්ත්වයක සිටින්නෙකුට තවත් පීඩාවකට මුහුණ දෙන්නට සිදුවුවහොත් ඔහු හෝ ඇය තවදුරටත් ජීවත්වීමේ තේරුමක් නැති බව සිතා දිවිනසා ගැනීමට පෙළඹෙන්නට පුළුවන. ගොවිතැනින් ජීවත්වන අය අතර වරින් වර සිදුවන දිවිනසා ගැනීම් මේ ආකාරයෙන් සිදුවීමට පුළුවන. ගොවිතැන් කරන්නවුන් ජීවත්වන්නේ තමන් වගා කර ලබා ගන්නා අස්වැන්න විකිණීමෙනි.

ඔවුනට බොහෝවිට සමාජමය වශයෙන් හවිහරණයක් නැත. වරක් ණය ලබාගෙන වගා කළ පසු එය නියඟයෙන් හෝ ජල ගැලීමෙන් විනාශ වේ. මින් මානසික පීඩාවක් ඇති වේ. දෙවන වර අස්වනු හොඳට ලැබුණත් විකුණා ගත නොහැකිවීම නිසා ණය ගෙවා දැමීමට නොහැකි වේ. මින් තවදුරටත් පීඩාවට පත් වන ගොවියාට තෙවන වරට ද මෙවන් අත්දැකීමක් ලැබීම දිවි එපා වීමට හේතුවනු ඇත.

යම් යම් අසම්මත විශ්වාස හා ආකල්ප වලින් හෙබි පුද්ගලයින් තමන්ගේ විශ්වාස වලට තවත් අය නතුකරගෙන කණ්ඩායම් වශයෙන් විමුක්තිය ලබා ගැනීමට දිවි නසා ගත් අවස්ථා පසුගිය කාලයේ වාර්තා විය. දෙවියන් වහන්සේ කෙරෙහි විශ්වාසය ඇතිකරලමින් ආත්ම විමුක්තිය උදෙසා තම අනුගාමිකයින් සමග ගිනි තබා ගෙන මියයාම කලකට පෙර අප්‍රිකානු රටකින් අසන්නට ලැබුණි.

දිවිනසා ගැනීම් වලක්වාලීමේදී එසේ කිරීමට වැඩි ප්‍රවණතාවක් ඇති අය හඳුනා ගත යුතු ය. තම

මෙරට සිදුවන දිවිනසා ගැනීම්වලට හේතුවන වැදගත් කරුණක් වන්නේ පළිගැනීමේ චේතනාවයි. මින් බලාපොරොත්තු වන්නේ තමන්ගේ මරණය නිසා අන් අයට මානසික වේදනාවක් හා පශ්චාත්තාපයක් ඇතිකර වීමයි.

චේතනාව ඍජුව පවසන්නන් අතර දිවිනසා ගැනීමේ වැඩි ඉඩක් තිබිය හැකි ය. එසේම අන් අය බියපත් කර තම අරමුණු ඉටුකර ගැනීමේ පරමාර්ථයෙන් එසේ කරන්නෝද වෙති. බලාපොරොත්තු සුන් වූ දුබල පෞරුෂයෙන් යුක්ත අය හා මීට පෙර දිවිනසා ගැනීමට තැත් කළ අය අතර දිවිනසා ගැනීමේ වැඩි ඉඩක් පවතී.

වැඩි අවදානමක් සහිත පුද්ගලයින් හඳුනාගෙන ඔවුනට මානසික වශයෙන් සහනයක් ගෙන දෙන අයුරින් කටයුතු කිරීම වැදගත් ය. තමන්ගේ ගැටලුව ගැන සහයෝගයෙන් කටයුතු කර එය විසඳා ගැනීමට උපකාරී වන අය ඇති බව ඒත්තු ගැන්විය යුතු ය. පුද්ගලයා රෝගී බවකින් පෙළේ නම් වෛද්‍යවරයෙක් වෙත යොමු කළ යුතු ය.

දිවිනසා ගැනීම්වල ප්‍රතිශතය වැඩිවීමට මෙරට පුවත්පත් ඇතුළු ජනමාධ්‍ය යහමින් දායක වී තිබේ. දිවිනසා ගැනීමට භාවිතා කරන ද්‍රව්‍ය, ක්‍රම හා විධි ගැන ඒවායේ පළ කරන වාර්තාවලින් අන් අයට ඒ සම්බන්ධයෙන් ඉගෙන ගැනීමට හැකි වේ. වර්තමානයේ දිවි නසා ගැනීමට භාවිත කරනු ලබන ශාක ගෙඩි වර්ගයක් ගැන මුළු ලංකාව පුරා ප්‍රචාරය කරනු ලැබුවේ සිංහල පුවත්පත් මගිනි. මෙය ප්‍රතිකාර පතා පැමිණි රෝගීන්ගෙන් ලබා ගත් ප්‍රකාශ අනුව පැහැදිලි වී තිබේ. තවද දිවිනසා ගැනීමේ වාර්තා අතිශයෝක්තියෙන් පළ කරනු ලබන අතර ඒවාට අන් අය වගකිව යුතුය යන හැඟීමක් ලබා දෙන අයුරින් සාධාරණීයකරණය කරන අයුරක් ද ඇති බව සමහරවිට පෙනේ. ඉංග්‍රීසි පුවත්පත්වල මෙවා සාමාන්‍යයෙන් පළ නොකෙරේ. ඇත්තෙන්ම මෙවැනි දේ ගැන වාර්තා පළ නොකළ යුතු අතර එසේ කරන්නේ නම් ඒවා එඩිතර බවින් තොර පහත් ක්‍රියාවන් ලෙස හුවා දැක්විය යුතු අතර ජීවත්වන්නන්ට වරද නොපැටවෙන අයුරින් ලිවිය යුතු ය.

ඇත්ත වශයෙන් ම දිවිනසා ගැනීම් වලක්වාලීමට මනෝ වෛද්‍ය ක්ෂේත්‍රයේ නිරත වන්නන්ට කළ හැක්කේ සීමිත කාර්යයකි. මීට දේශපාලනික හා සාමාජීය වශයෙන් තදබල බලපෑමක් කළ යුතු ය. ❑